VIDU 82 3-6

# විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය

**සුසන්ත ගුණතිලක**

පර්යේෂණ අධ්‍යක්ෂ, මහජන බැංකුව, කොළඹ 1.

විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය කෙරෙහි බලපාන, විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්තියට අදාළවූ කරුණු කීපයක් පිළිබඳව සාකච්ඡා කිරීමට මෙම ලුහුඬු ලිපියෙන් අදහස් කර ඇත. මෙය විධිමත් ලේඛනයක් නොවුවද, අදාල ගැටළු කිහිපයක් ගැන අවධානය යොමු කිරීමේ ප්‍රයත්නයක් ලෙස සැලකිය හැකිය.

විද්‍යා හා තාක්ෂණික ප්‍රතිපත්තියේ පරිමාණ දෙකක් ඇත. එනම් විද්‍යාවේ හා තාක්ෂණයේ පාලනය මෙහෙයවීම හා ප්‍රගතිය අධ්‍යයනය කරන ශාස්ත්‍රීය ශික්ෂණය ඉන් පළමුවැන්නයි. විද්‍යාත්මක හා තාක්ෂණික ප්‍රතිපත්තීන් සාමාජික හා ආර්ථික වෙනසියාවන් කෙරෙහි බලපෑම ඇතිකරවන නියායෙන් කාර්ය අභිමුඛ වශයෙන් ඇති ප්‍රායෝගික මට්ටම දෙවැනි පරිමාණයයි. ශාස්ත්‍රීය වශයෙන් විද්‍යා හා තාක්ෂණික ප්‍රතිපත්තිය ශුද්ධ විද්‍යාවන් හා සමාජීය විද්‍යාවන් අතර රැඳී පවත්නේය. මෙසේ බලන කල විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ සමාජ විද්‍යාවකුත්, විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ අර්ථ ශාස්ත්‍රයකුත් තවත් ගැඹුරට සිතන විට විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ මනෝවිද්‍යාවකුත් දක්විය හැකිය. විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ සමාජ විද්‍යාව තවදුරටත් බෙදා වෙන්කළහොත් වෛද්‍ය විද්‍යාව පිළිබඳ සමාජ විද්‍යාව, තාක්ෂණික විපර්යාසයේ සමාජ විද්‍යාව ආදී වශයෙන් උපාංග දක්නට ලැබේ. විද්‍යාවේ හා තාක්ෂණයේ සංඝටනයක් ඇතිකළ සමාජීක හා ආර්ථික සාධක මෙන්ම සමාජීක හා ආර්ථික විෂයෙහි සංඝටනයක් ඇතිකළ විද්‍යාත්මක හා තාක්ෂණික සාධක හඳුනාගැනීමට පසුගිය වසර කිහිපය ඇතුළතදී බොහෝ අය ප්‍රයත්න දරා ඇත. මෙබඳු අධ්‍යයනයන්හි ආරම්භය මාක්ස්ගේ ඉතා වැදගත් කෘති ඇතුලු 19 වන සියවසේ යුරෝපයේ බිහිවූ වෙනත් කෘතීන්හි දක්නට ඇත. පසුව බර්න්හැම්, කූන්, ප්‍රයිස් හා අනිකුත් අයගේ විස්තරාත්මක හා තර්කාන්විත විභාග හා අධ්‍යයනයන් මගින් විද්‍යාව හා තාක්ෂණයත් සමාජීය — ආර්ථික ක්ෂේත්‍රයත් අතර සම්බන්ධතාවය වඩා පරිපූර්ණ වශයෙන් විදහා දක්වේ. එක් අතෙකින් සමාජයත් අනිත් අතට විද්‍යාවේ හා තාක්ෂණයේ අන්‍යොන්‍ය බලපෑමත් ගෙනහැර දැක්වීම සඳහා මොවුහු ශුද්ධ විද්‍යාවන් හා සමාජීය විද්‍යාවන් අතර වූ කලාපයට අයත් විෂය පිළිබඳව ලියා ඇත.

ශුද්ධ විද්‍යා හා අදළ තාක්ෂණයේ උද්ගත වූ අර්බුදයකට සමාන තත්ත්වයක් සම්බන්ධයෙන් මෑතක සිට බටහිර ලෝකයෙහි මෙම විෂයට අදළ කටයුතු සඳහා අතිශයින් වැදගත් තැනක් ගෙන ඇත්තේය. පසුගිය ශත වර්ෂ කිහිපය ඇතුළතදී විද්‍යා හා තාක්ෂණ සංවර්ධනය යොමුවූ දිශාව අද ඇතැම් අයගේ පුළුල් විචාරයට ලක්වී තිබේ. පරිසරය, ජීවන තත්වය ආදිය ගැන දැන් යොමුවී ඇති සැලකිල්ල මෙම විමසුමෙහි වඩාත් ප්‍රත්‍යක්ෂ වූ හා ආශ්‍රිත මුහුණුවර වේ. තවද කේන්ද්‍රීය රටවලට ගැතිබව තවත් වර්ධනය කිරීමට මඟ පෑදීමක් ලෙස සලකා බැහැරින් ගත් තාක්ෂණික ක්‍රමවල යෝග්‍යතාවය තුන්වන ලෝකය තුළ විමසුමට භාජනය වෙමින් පවතී. පිටරටවලින් ගත් තාක්ෂණයන්හි හා බහුජාතික සංස්ථාවල කාර්ය භාරය තුන්වන ලෝකයේ දැඩි විශ්ලේෂණයට හා සාකච්ඡාවට භාජනය වී ඇත. එපමණක් නොව, තෙවන ලෝකයේ උගතුන් හා සානුකම්පී බටහිර උගතුන්ද, බටහිර ලොව ඓතිහාසික සංවර්ධනයට හේතු ප්‍රත්‍ය වූ මූලද්‍රව්‍යය හා භාණ්ඩ වශයෙන් තුන්වන ලෝකයේ රටවල් වන අප උපයෝගී කරගත් එකී සංවර්ධනයෙන් උද්ගතවූ සියලු ජීවන විලාස හා විද්‍යා හා තාක්ෂණ ක්‍රමද ප්‍රශ්න කිරීමට පටන් ගෙන ඇත. අද බටහිර ලොව සතු විද්‍යාව හා තාක්ෂණය, බටහිර මිනිසා තුන්වන ලෝකය යටත් පාලනයට හසුකරගත් අවධියේ කැටි කර ගත් ඉතිහාසය හා අත්දැකීම් වශයෙන් සැලකිය හැකිය. මෙම විමසීමේ හා ප්‍රතිපත්තිමය ආකල්ප නිසා විද්‍යා හා තාක්ෂණ පදනම වශයෙන් දැක්වූ උපකල්පිත විෂය මූලිකත්වයේ ගරු ගාම්භීරත්වය දැන් ඉවත්වී ඇත. විද්‍යාත්මක විෂය මූලකත්වය උද්ගත වන්නේ යම් සාමාජික හා ඓතිහාසික සීමා ඇතුලත වන බැවින්, එය ඒකාන්තයෙන් 'විෂය මූලක' නොවන බව පෙනේ. බටහිර ලොව විද්‍යාවේ හා තාක්ෂණයේ වර්ධනය සිදුවූයේ, ඓතිහාසික කාර්යාවලිය තුලින් උත්පාදිත විද්‍යාත්මක හා තාක්ෂණික ප්‍රගතියේ ප්‍රතිඵලයක් වශයෙනි. අප මෙම ඓතිහාසික ක්‍රියාවලියේ 'ආගන්තුකයන් මෙන්ම ප්‍රස්තුත විෂයද වීමු. දැන් අපගේ මූලික අරමුණ විය යුත්තේ සමාන තත්ත්වයේ හවුල්කරුවන් වශයෙන් ඉතිහාසයට යළි පිවිසීමත්, අපගේ අදහස් උදහස් හා අවශ්‍යතාවයන්ට ගැල පෙන අයුරු විද්‍යාව හා තාක්ෂණය යළි හැඩගස්වා ගැනීමත්ය.

ශ්‍රී ලංකාවේ විද්‍යා ප්‍රතිපත්තියෙහි ඉහතින් සඳහන් පෘථුල සංකල්පනාවලට තැනක් දී නැත. යථෝක්ත තර්කාන්විත සංකල්පනා ඇසුරු නොකළ පොදු ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම් සමායෝජනය කිරීම සඳහා වුවද රාජ්‍ය මට්ටමෙහි විධිමත් ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සිදුවී නැත. ශ්‍රී ලංකාවට අදළ වූ විද්‍යා හා තාක්ෂණය පිළිබඳ ගැටළුවල විවිධ මුහුණුවර සම්බන්ධයෙන් ජී. සී. එන්. ජයසූරිය, ඔස්මන්ඩ් ජයරත්න, ආර්. ඕ. බී. විජේසේකර යන ලේඛකයන් හා මා විසිනුදු ලිපි ලියා ඇත. එසේ වුවද එම සංකල්පනාවලින් විධිමත් තීරණ ගැනීමෙහිලා කිසිදු බලපෑමක් ඇති වී නැත.

විධිමත් විද්‍යා ප්‍රතිපත්තියක් නොමැතිවීමට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ, දේශපාලනමය තීරණ ගන්නා අයට විද්‍යාවේ හා තාක්ෂණයේ වැදගත්කම පිළිබඳව නොවැටහීමයි. ශ්‍රී ලංකාවේ මෙම තත්ත්වය ඉන්දියාවේ හා චීනයේ තත්ත්වයන් සමඟ සංසන්දනය කර බැලිය යුතුය. එක්තරා විශිෂ්ඨ ජන කොට්ඨාශයකට පමණක් සීමාවූ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තියක් ඉන්දියාවේ අනුගමනය කරනු ලැබූ අතර චීනයේ තත්ත්වය වඩාත් පොදු ජන ආශ්‍රිත වූවකි. එසේ වුවද දෙරට කටයුතු අතර සමානත්වයක් ඇත. එමෙන්ම දෙරටම අද ප්‍රබල විද්‍යාත්මක හා තාක්ෂණික බලවේග දෙකක් බවට පත්වී ඇත. ඉන්දියාවේ විද්‍යාවේ හා තාක්ෂණයේ අභිවර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ ජවහර්ලාල් නේරු මහතාගේ පෞරුෂත්වයයි. නිදහස ලබාගත්තාට පසුව එළඹි යුගයේදී ඔහු විද්‍යාව සිය විෂය පථයට පත්කොට ඊට ප්‍රමුඛත්වය ලබාදී පෘථුල විද්‍යාත්මක ව්‍යුහයක් බිහිකළේය. ලොව අන් ඕනෑම රටක් සමග තරඟ කළ හැකි විද්‍යාත්මක අන්තර් ව්‍යුහයක් අද ඉන්දියාවට ඇත.

ඉහළ නායකත්වයට මේ පිළිබඳව වැටහීමක් නොතිබීම නිසා අභාග්‍යයකට මෙන් ශ්‍රී ලංකාවේ විධිමත් විද්‍යා හා තාක්ෂණික ප්‍රතිපත්තියක් බිහිවී නැත. කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ කොටසක් වශයෙන් විද්‍යා කටයුතු අමාත්‍යාංශයක් පිහිටුවා ඇති නමුදු, රටෙහි ප්‍රබල බලපෑමක් ඇති කරවීමට තරම් ප්‍රමාණවත් බලතල ඊට පවරා නැත. විධිමත් විද්‍යාත්මක හා තාක්ෂණික ප්‍රතිපත්තියක් නොතිබුණද, විද්‍යාව හා තාක්ෂණය කෙරෙහි රජයට වූ වගකීම විකිරණ ලෙස වුවද වර්ධනය වී ඇත. එමනිසා තුන්වන ලෝකයේ අනිකුත් රටවල විද්‍යාඥයන්ට වඩා අද අපගේ විද්‍යාඥයෝ නොයෙකුත් ක්ෂේත්‍රවල නිපුණතාවයක් ඇති අය වෙති. මෙසේ හෙයින් අප රට කුඩා එකක් වුවද, අපගේ විද්‍යාත්මක හා තාක්ෂණික අන්තර් ව්‍යුහය අප්‍රිකාවේ හා ආසියාවේ මධ්‍යම ප්‍රමාණයේ රටවලට වඩා ප්‍රබල වූවකි. මෙයාකාරයෙන් විද්‍යාව හා තාක්ෂණය නොදැනුවත් වම වර්ධනය වීම නිසා අද අපේ බොහෝ විද්‍යාඥයෝ වඩාත් සමෘද්ධිමත් රටවල් කරා ඇදී යති. ඔවුන් මෙසේ එබඳු රටවල්වලට ඇදී යන්නේ මුදල් සඳහා පමණක් නොව විද්‍යාත්මක වැදගත්කම පිළිගැනීමේ හේතුවද නිසාය. මෙසේ

විදෙස් කරා ඇදී ගිය විද්‍යාඥයන් හා තාක්ෂණඥයන් කාර්ය තෘප්තියක් නොලැබීම හා විද්‍යාත්මක හා තාක්ෂණික තීරණ ගැනීම ආධුනිකයන්ට, විශේෂයෙන් පරිපාලන සේවා නිලධාරීන්ට, පවරා දී තිබීම මේ සඳහා මුල්වූ වැදගත් හේතුව වශයෙන් දක්වති. ලොව අන් රටවල සංවර්ධනය මෙන්ම ධනවාදී හා සමාජවාදී රටවල ඉතා උසස් බලධාරීන්ගෙන් සමන්විත විද්‍යාත්මක උපදේශක මණ්ඩල බිහිවීම දැක ඇති අප විද්‍යාඥයන්ට ශ්‍රී ලංකාවේ විද්‍යා කටයුතු ආධුනිකයන්ගේ පාලන පථයට හසුව තිබීම නොරුස්නා විෂමතාවයකි. දේශීය විද්‍යාත්මක හා තාක්ෂණික කටයුතුවල නියුතු පිරිස් සමඟ සාකච්ඡා කිරීමේදී මේ පිළිබඳව ඔවුන් තුළ දැඩි ඉච්ඡාභංගත්වයක් හා නොරුස්නා බවක් පවත්නා බව පෙනේ.

මෙබඳු තත්ත්වයකට තුඩුදුන් තවත් කරුණක් නම් දේශීය විශේෂඥයන් සිටියදී විදේශාධාරවල කොටසක් වශයෙන් එතරම් උසස් තත්ත්වයක නොවූ විශේෂඥයන් මෙහි එවීමය. දේශීය විශේෂඥයන් නොමැති ක්ෂේත්‍රවල මොවුන්ට ඒකාන්තයෙන්ම තැනක් ලැබෙන නමුදු, මොවුහු වැඩි දෙනෙක්ම විශිෂ්ඨ ප්‍රවීනත්වයෙන් යුතු ශ්‍රී ලාංකිකයන් ඇති ක්ෂේත්‍රවලට අයත් වෙති. මීට උදහරණයක් නම් ග්‍රාම සංවර්ධනයේ පටන් පරමාණු භෞතික විද්‍යාව දක්වාවූ විෂය පිළිබඳව ප්‍රවීනත්වයක් නොමැති විදේශිකයන්, ශ්‍රී ලාංකික සමුළුවලදී මේවා ගැන ප්‍රකාශ ඉදිරිපත් කිරීමට ඉඩදී තිබීමය. පූර්ව යටත් විජිත යුගයේ පළාත්බද පාසැලක ත්‍යාග ප්‍රදානෝත්සවයක සුදු දිසාපතීන් ක්‍රියාකළ ආකාරය මෙහිදී සිහිපත් වේ.

විද්‍යා හා තාක්ෂණ විද්‍යා ප්‍රතිපත්තියක ඇති වැදගත්කම දේශපාලන බලධාරීන්ට වටහාදීම උදෙසා ජාතික විද්‍යා සභාව, විද්‍යාභිවර්ධන සංගමය හා ජාතික විද්‍යා අභ්‍යාස ආයතනය විසින් පසුගිය මාස කිහිපය ඇතුලතදී නොයෙකුත් පියවර ගෙන ඇත. පසුගිය මහා මැතිවරණයේදී එක් වැදගත් දේශපාලන පක්ෂයක් පමණක් විද්‍යාත්මක හා තාක්ෂණික විද්‍යාත්මක ප්‍රතිපත්තිය සිය ප්‍රකාශනයේ ඇතුලත් කළ නමුදු අනිකුත් සියලුම පක්ෂ විසින් එය නොසලකා හරින ලදී. විද්‍යාවේ හා තාක්ෂණයේ මනා වර්ධනය සඳහා මෙන්ම ඵලදායී විද්‍යාත්මක ප්‍රජාවක් බිහිකිරීම උදෙසා උසස් මට්ටමේ ක්‍රමික නිරන්තර අනුග්‍රහය හා විධිමත් පිළිගැනීමද අත්‍යාවශ්‍ය වේ. මෙම පරමාර්ථය ඉෂ්ඨ කර ගැනීම සඳහා, විද්‍යාඥයන් හා තාක්ෂණඥයන් විද්‍යාවට හා තාක්ෂණයට හිමි වැදගත් තැන ලබාදීමට මෙන්ම ආර්ථිකයේ විවිධ ක්ෂේත්‍රයන්හි විද්‍යාව හා තාක්ෂණය උපයෝගී කරගැනීමටද සෑම අංශයකින්ම බලපෑම් ඇති කළ යුතුය. මේ සම්බන්ධයෙන් යොදාගත හැකි උපක්‍රම කිහිපයක් නම්, විද්‍යාත්මක සංගම් හා වෘත්තීය සමිති මගින් බලපෑම් ඇති කිරීම හා දේශපාලඥයන් අවනත කරවා ගැනීමය. විද්‍යා ප්‍රතිපත්තිය පිළිබඳ නව ශාස්ත්‍රීය විෂයයන් තුළින් පිළිබිඹු වන කරුණක් නම්, විද්‍යාව, තාක්ෂණය සහ දේශපාලනය එකිනෙකින් වෙන් කළ නොහැකි බව හා සමාජයීය හා විද්‍යාත්මක ව්‍යුහයන් අතර දැඩි සම්බන්ධතාවයක් ඇති බවය.

විද්‍යා හා තාක්ෂණික ප්‍රතිපත්තියේ සංයුතිය, ඒ ඒ රටෙහි ප්‍රත්‍යක්ෂ ආර්ථික හා දේශපාලනමය කෘත්‍යයන් මගින් හා විද්‍යාත්මක සංවර්ධනයේ නෛසර්ගික අවශ්‍යතාවයන් මගින්ද නිර්ණය කෙරේ. මිනිසාට බලපාන කටයුතු පිළිබඳ අනිකුත් ක්ෂේත්‍ර මගින් විද්‍යාවද සාපේක්ෂක ස්වාධීනත්වයකින් යුතුවන අතර එය දේශපාලනය කෙරෙහි ප්‍රබල ලෙස බලපාන බැවින් දේශපාලන කෘත්‍යයන් ආර්ථික, විද්‍යාත්මක හා තාක්ෂණික පරමාර්ථයන්ට දෙවැනි වේ. විද්‍යාත්මක සංවර්ධනය, නව විද්‍යාත්මක සංකල්පයන් බිහිවීම හා විද්‍යාවේ සමාජයීය කාර්යභාරයේ ඇතිවන වෙනසියාවන්ද සමග විද්‍යා හා තාක්ෂණික ප්‍රතිපත්තියද වෙනස්විය යුතුය. ඒ ඒ රටවල සාමාජික – ආර්ථික සංවර්ධන පරමාර්ථයන්ට අනුකූලව විද්‍යාත්මක ආයතන විද්‍යාත්මක කළමණාකරණ ව්‍යුහය පිළිබඳ පද්ධතීන් බිහිවීම හා විද්‍යා හා තාක්ෂණික සංවර්ධන දිශාව නිර්ණයකිරීම සිදුවූවද, විද්‍යාත්මක හා තාක්ෂණික ප්‍රතිපත්තින්හි සියළුම රටවලට පොදුවූ ඇතැම් අංග දක්නට ඇත.

යුනෙස්කෝ සඟරාව.